සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018
Second Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | Christianity | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

**වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. කිතු උපත සුවිශේෂී වන්නේ?
   i. දීප්තිමත් තාරවක් පෑවීම නිසාය ii. දේවදූතයන් ගී ගැයීම නිසාය
   iii. දිළිඳු එඬේරුන් ලැබූ ශුභාරංචිය නිසාය iv. බෙත්ලෙහෙම තෝරාගත් නිසාය

02. තරුණ ස්නාවක ජොහාන්ගෙන් ආභාසය ලබන කිතුනුවන් ගත කළ යුතු වන්නේ?
   i. හුදකලා ජීවිතයකි ii. වනවාසී ජීවිතයකි
   iii. සමාජ ආශ්‍රයෙන් තොර ජීවිතයකි iv. දේව ගරු බිය ඇති ජීවිතයකි

03. 'මා පියාණන් මැදුර' යන්නෙන් ජේසුස් වහන්සේ අර්ථ දැක්වූයේ?
   i. ආගමික සංස්ථාය ii. දේවමාලිගයය iii. දේව සේවයය iv. ආගමික වත් පිළිවෙත්ය

04. ඉශ්‍රායෙල් ඉතිහාසයේ ආරම්භය සනිටුහන් වනුයේ?
   i. දි ආබ්‍රහම්තුමාගේ කැඳවීමෙනි ii. ජේසුස් වහන්සේගේ පැමිණීමෙනි
   iii. මෝසෙස්ට දසපනත ලැබීමෙනි iv. විප්‍රවාසයට ගෙන යෑමෙනි

05. මිනිසා හා දෙවියන්වහන්සේ අතර සබඳතාව දක්වන පනතකි
   i. මිනී නොමරව යන්න iii. අසල්වැසියා සතු කිසිවකට ඇලුම් නොකරව යන්න
   iii. සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න යන්න
   iv. 'සොරකම් නොකරව' යන්න

06. ජේසුස් වහන්සේ මුල් ගෝලයන් කැඳවීමේ සිදුවීමෙන් අප ඉගෙන ගන්නා ප්‍රධාන පාඩම නම්,
   i. තම වෘත්තිය පිළිබඳ හසල නිපුණතාවයක් අප සතු විය යුතු බවය
   ii. දේව රාජ්‍යයීය සේවය සඳහා ලැබෙන කැඳවීමට අප ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු බවය
   iii. නිරතුරුවම සමාජ පිළිගැනීමට අප නතු විය යුතු බවය
   iv. දේව සේවය සඳහා මනා පුහුණුවක් අප ලැබිය යුතු බවය

07. ගීතාවලිය 23 වන ගීතයෙහි සඳහන් පරිදි සුනිල් තණ බිම් මත සතප්වා යන්නෙන් ඉදිරිපත් කෙරෙන එඬේර කාර්යය නම්,
   i. මඟපෙන්වීමයි ii. පෝෂණයයි iii. කැපකිරීමයි iv. හඳුනාගැනීමයි

08. පැරණි ගිවිසුම් සිද්ධීන් කිහිපයක් පහත දැක්වේ
A- සිරියානු ජාතික නාමන් පිළිබඳ සිදුවීම
B- ආදම් හා ඒව පිළිබඳ සිදුවීම
C- එස්තර් බිසව පිළිබඳ සිදුවීම
D- ශාරෙපත්හී වැන්දඹුව පිළිබඳ සිදුවීම

ඒ අතුරෙන් නාසරෙත් ධර්මාශාලාවේදී ජේසුස් වහන්සේ ගෙනහැර පෑ නිදසුන් දැක්වෙන්නේ?
i. A හා B ය  ii. A හා D ය  iii. B හා C ය  i. C හා D ය

09. වපුරන්නාගේ උපමාවේ සඳහන් ලෙස සරුබිමේ වැටුණු බීජ එකකින් සිය ගුණයක් ඵල දරන්න සේ දේවරාජ්‍යය,
i. ගණනින් හා බලයෙන් වැඩි වේ  ii. සෞභාග්‍ය අත්කර ගනියි
iii. සියලු බාධක නොතකා ඉදිරියට යයි  iv. කිතුනුවන් සැමදෙනාගේම ජීවිත සරු කරයි

10. සාමය ඇති කිරීමට වෙහෙසන කිතුනු සිසුවකුගේ ප්‍රධාන කාර්යය විය යුතු වන්නේ,
i. සාමය වනසන්නන්ට එරෙහි වීමයි  ii. සාමය බිඳීයන ක්‍රියාවලින් වැළකී සිටීමයි
iii. සාමය සම්බන්ධ වැඩසටහන් සංවිධානය කිරීමයි  iv. සාමය ඇති කිරීමට ක්‍රියා කරන ආයතන හා සම්බන්ධව ක්‍රියාකාරී වීමයි

11. ශු. බයිබලීය රාජ්‍ය සංකල්පය රජතුමා ඉදිරිපත් කරන්නේ?
i. විමුක්තිය උදාකරන කෙනෙකු ලෙසය  ii. මනා පෞරුෂයකින් හෙබි කෙනකු ලෙසය
iii. සාධාරණත්වයේ ප්‍රතිමූර්තියක් ලෙසය  iv. බලයෙන් හා ඥානයෙන් පිරි කෙනකු ලෙසය

12. ආබ්‍රහම්ගේ වංශයේ විශාලත්වය දැක්වීම සඳහා දෙවියන් වහන්සේ භාවිත කළ සංකේත වූයේ,
i. පොළොවේ ගල් හා අහසේ තරුය  ii. පොළොවෙ ගස් හා මුහුදේ රළය
iii. පොළොවේ මිණිමුතු හා මුහුදේ රළය  iv. පොළොවේ දූවිලි හා අහසේ තරුය

13. නැති වු පුත්‍රයාගේ කතාව මගින් ඉදිරිපත් වන විශේෂ දේව රාජ්‍යයීය ප්‍රතිපත්තිය යනු,
i.පරාර්ථකාමීව දිවි ගෙවීමේ අවශ්‍යතාවයයි  ii. කීකරුකමේ වැදගත්කමයි
iii. අසීමිත දේව ප්‍රේමයට නතුවීමේ වැදගත්කමයි  iv. අන් අයට උපකාර කිරීමේ අවශ්‍යතාවයයි

14. ස්නාවක ජොහාන් මෙන් කඳු හෙල් සමතලා කිරීමට ඉදිරිපත් වන කිතුනුවන්,
i. සමාජ පැවැත්ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජීවිතාදර්ශයෙන් ක්‍රියා කළ යුතුය
ii. ජනතාවට දීර්ඝ දේශනාවන් තුළින් අනුශාසනා කළ යුතුය
iii. භෞතික පරිසරය වෙනස් කිරීම සඳහා දිරි දැරිය යුතුය
iv. සමාජ අවශ්‍යතාවයන් ඉටු කිරීමට කැපවිය යුතුය

15. යෙසායා දිවැසිවරයා පවසන පරිදි මෙසියස් වහන්සේගේ අරමුණ වනුයේ,
i. රජවරුන් පාලනය සඳහා ආලේප කිරීමයි  ii. සදාකාලික සාම රාජ්‍යයක් බිහි කිරීමයි
iii. බාහිරආක්‍රමණවලින් රාජ්‍ය සුරකීමයි  iv. අසල්වැසි රාජ්‍ය සමඟ ගිවිසුම්වලට එළඹීමයි

16. ජේසුස් වහන්සේ මිනිසත් බව ලබාගෙන ජුදෙව්වන් හා විජාතීන් අතර වෛරය ඇති කළ ................................ කඩා දැමූ සේක.
ඉහත හිස්තැනට සුදුසු වචනය නම්,
i. 'ගේට්ටුව' යන්නයි  ii.පාලම යන්නයි  iii. මැද බිත්තිය යන්නයි  iv. 'කුරුසිය' යන්නයි

17. ජේසුස් වහන්සේගේ ගෙත්සෙමනේ යැදුම අපට උගන්වනුයේ,

i. ශෝකය දරා ගැනීමටයි
ii. දේව ප්‍රතිචාර ලැබෙන බවය
iii. නිසි ලෙස යාච්ඤා කල යුතු බවය
iv. දේව කැමැත්තට හිස නැමීමටය

18. අංශභාග රෝගීයා සුව කිරීමේ සිදුවීමේදී ජේසුස්වහන්සේ පෙන්වා දුන් පරිදි මනුෂ්‍ය පුත්‍රයාණන්ට බලය ඇත්තේ,

i. පව්කමා කිරීමටය
ii. රෝග සුව කිරීමටය
iii. ප්‍රාතිහාර්ය ඉටුකිරීමටය
iv. එකිනෙකා හා විවාද කිරීමටය

19. මිටියාවතේ දේශනයෙන් පිළිබිඹු වූ විශේෂ ලක්ෂණයකි,

i. එය විශාල ජනකායකගේ සහභාගීත්වයෙන් පැවැත්වීම
ii. එය දුර්ලභ මිටියාවතක පැවැත්වීම
iii. එය දිළිඳු ඇයට පමණක් විශේෂිත වූ දේශනාමාලාවක් වීම
iv. එහි ඉගැන්වීමේ ලෝකය අගය කරන වටිනාකම් අභිබවා යෑම

20. මුල් කිතුනු සභාව බිහිවූයේ,

i. පෙන්තකොස්ත දිනය ii. පාස්කු දිනය iii. ස්වර්ගාරෝහණ දිනය iv. නත්තල් දිනය

21. කිතුනු බව්තීස්මය අති වැදගත් වනුයේ,

i. එමඟින් සදාතන දිවිය උරුම වන නිසාය
ii. එමඟින් ශුද්ධාත්ම වැඩසිටීම මැද දේව සබඳතාව වර්ධනය කරන නිසාය
iii. එමඟින් ජීවිත පවිත්‍රතාවට මං පැදෙන නිසාය
iv. එමඟින් ලෞකිකත්වයෙන් අප වෙන් කරනු ලබන නිසාය

22. දිළිඳු වැන්දඹුවගේ පූජාවෙන් කිතුනුවාට මග දක්වන්නේ,

i. අන් අයට වඩා වැඩි පූජාවන් පිදීමටය
ii. සියල්ලන් ඉදිරියේ පූජාවන් පිදීමටය
iii. වැයවීමේ ආත්මයෙන් පූජාවන් පිදීමටය
iv. මූල්‍යමය පූජාවන් සඳහා මුල්තැන දීමටය

23. 'ප්‍රේමය' නොමැති අය පාවුල්තුමා සමාන කරනු ලබන්නේ,

i. සෝෂාකරන සාන්ටාරයකටය
ii. දේවදූතයන්ටය
iii. සකල ඥානය ලබා දෙන උල්පතකටය
iv.අභිරහස් මැදුරකටය

24. ජේසුස් වහන්සේගේ නාසරෙත් දේශනයෙන් පසුව ජනතාව විරෝධය පෑවේ,

i. උන්වහන්සේ සිය ප්‍රතිපත්තීන් ඉදිරිපත් කළ බැවිනි
ii. විජාතීන් පැසසුමට ලක් කළ බැවිනි
iii. උන්වහන්සේගේ පවුල් පසු බිම දැන සිටි බැවිනි
iv. ප්‍රාතිහාර්යයක් සිදු නොකළ බැවිනි

25. 'ක්‍රිස්තොස්' යන්නෙන් අරුත් ගැන්වෙනුයේ,

i. සමිදාණෝ ධර්මිෂ්ටය' යන්නයි
ii. ආලේපලත් තැනැත්තා' යන්නයි
iii. මරණය පරාජය කරන තැනැත්තා යන්නයි
iv. ආලේපලත් තැනැත්තා දෙවිඳුන් විසින් විශේෂ කාර්යයන් සඳහා කැඳවීම' යන්නයි

26. 'වගවලසුන් මැදට යුවන බැටළු පැටවුන් මෙන් මම ඔබ යවමි' යන්නෙන් පවසමින් ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,

i. පරිසිවරුන්ගේ දුර්ගුණය
ii. බැටළු එඬේර රැකියාවේ තත්ත්වය
iii. දේව රාජ්‍යයේ ආදීනවය
iv. ධර්මදූත සේවයේ භාරදූරත්වය

27. මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නටද, ගළවාගන්ටද වැඩම කළ සේක' යනුවෙන් ජේසුස් වහන්සේ පවසන ලද්දේ,

i. ලෙවීගේ නිවසේදීය
ii. මාර්තා හා මරියාගේ නිවසේදීය
iii. සාකෙවුස්ගේ නිවසේදීය
iv. සීමොන් නම් පරිසිවරයාගේ නිවසේදීය

28. මුල් කිතුනු සභාව ගැටලු නිරාකරණය සඳහා යොදාගත් ක්‍රම කිහිපයක් පහත දැක්වේ

A- විසඳුම් සෙවීමට ක්ෂණිකව ක්‍රියාත්මක වීම
B- මූල්‍යමය ගැටලු සඳහා පමණක් විසඳුම් සෙවීම
C- සාකච්ඡාවෙන් ශුද්ධාත්ම බලය තුළ ගැටලු විසඳීම
D- ගැටලු විසඳීම සඳහා සෑම විටම බාහිර පාර්ශව යොදා ගැනීම

මේ අතුරෙන් නිවැරදි වනුයේ,

i. A හා B ය ii. A හා C ය iii. B හා C ය i. C හා D ය

29. ධනවතා හා ලාසරස්ගේ උපමාව මගින් ඉදිරිපත් කෙරෙන ජීවන රටා දෙක සඳහාම පොදු ධර්මතාවය නම්,

i.මරණය ii. සැප සම්පත්ය iii. දේවරාජ්‍යයේ පුරවැසිභාවය iv. දැහැමි බව

30. ජේසුස්වහන්සේ සහෝදරත්වය හා සහභාගීත්වය වර්ධනය සඳහා යොදාගත් සංකේත වූයේ,

i. මිදිවැල හා බැටළුවන්ය
ii. කොටළුවා හා දේවමාළිගය
iii. රොටිය හා කුසලානය
iv. අබ හා මුහුන්ය

31. එම්මාවුස් ගමට ගිය ශ්‍රාවකයන්ගේ සිදුවීම කිතුනු අපට උපකාර වනුයේ,

i. බලාපොරොත්තු කඩවූ අවස්ථාවල ජීවමාන ජේසුස්වහන්සේ දැකීමටය
ii. ශුද්ධ ලියවිල්ලේ කරුණු මැනවින් අවබෝධ කරගැනීමටය
iii. දුරබැහැර ගමන්වලදී සුරක්ෂිතතාව අත්දැකීමටය
iv. ජීවිත ගැටලු සියල්ල නිරාකරණය කර ගැනීමටය

32. පාවුල්තුමාගේ ජීවිත පරිවර්තනයට බලපෑ හේතුවක් ලෙස සැලකිය හැක්කේ,

i. රෝම පුරවැසිභාවය හිමිවීමයි
ii. පීඩා මැද කිතුනුවන් සතු වූ ස්ථිර ඇදහිල්ලයි
iii. සිලිසියාවේ තාර්සස් නුවර ඉපදීමයි
iv. ජුදෙව් දහම කෙරෙහි තිබූ ඇල්මයි

33. ධර්මිෂ්ඨකම ජීවිතයට අත්පත් කර ගැනීම සඳහා ඉටු විය යුතු පියවර වශයෙන් පාවුල්තුමා දක්වනුයේ,

i.රන් රිදී වැනි සම්පත් අත්පත් කර ගැනීම - දිළිඳුන්ට බෙදාදීම - ලෞකික සතුට ලැබීම
ii. නිෂ්ඵල ජීවිතමාර්ගවලින් මිදීම - මනස සන්සුන් කර ගැනීම - භාවනාවට යොමු වීම
iii. තෘෂ්ණා සංසිඳුවා ගැනීම - ලෞකික දිවිය සකසා ගැනීම - දෙවිඳුන්ට භාර වීම
iv. ක්‍රිස්තුස්වහන්සේ අත්පත් කරගැනීම - උන්වහන්සේ සමඟ ඒකාබද්ධ වීම - ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහීම

34. යාච්ඤාව කිතුනු අප සතු ප්‍රබල අවියක් වනුයේ,

i. පුද්ගලික සබඳතා වර්ධනය කර ගැනීමටය
ii. දේවාසිරි අත්පත් කර ගැනීමටය
iii. දිව්‍යමය අනාවරණ ලබා ගැනීමටය
iv. දේව සබඳතාව ගොඩනගා ගැනීමටය.

35. පාවුළු තුමාට අදාළ සිදු වීම් කිහිපයක් පහත දැක්වේ.

| නගරය | සිදුවීම |
|---|---|
| 1. කොරින්තිය<br>2. පාපස්<br>3. පිලිප්පිය<br>4. ඇතන්ස් | A - කූඩාරම් කර්මාන්තයේ යෙදීම<br>B - සර්ගියස් පාවුලස්ගේ හැරීම<br>C - සිරගතවීම<br>D- නාඳුනන දෙවිඳුන්ගේ පූජාසනය හමු විය |

එම සිදුවීම් අතුරෙන් පිළිවෙළින් යහපත් හවුල් නායකත්වය, ස්ථානෝචිත ප්‍රඥාව තම අවශ්‍යතා තමා විසින් සලසා ගැනීම හා අභියෝග මැද සේවය විදහා දැක්වෙන පිළිතුර නම්,

i. A, B,Dය ii. A,D,C,Bය iii. B,DACය i. D,C,B , A ය

36. දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ නායකත්ව ධූරාවලියට අදාළනොවන්නේ,

i. නායකයා යටත් අයට සේවය කිරීමයි ii. නායකයා අණසක පැතිරවීමයි
iii. ප්‍රේමයේ ආධිපත්‍ය දැරීමයි iv. සාමකාමීව සහයෝගයෙන් කටයුතු කිරීමයි

37. 'ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් දිරිමත් කරන්න'' යන ජේසුස්වහන්සේගෙන් පේදුරු ලද උපදෙස් අප යොමු කරවන්නේ,

i. පසුතැවිල්ලෙන් දිරිය ලැබීමටය ii. ඉවසීමෙන් දිරිය ලැබීමටය
iii. සමාව දානය කිරීමෙන් දිරිය ලැබීමටය iv. සැනසීමෙන් දිරිය ලැබීමටය

38. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ආදර්ශය ලෝක ආගමික සමාජයක් මෙහෙයවීමට යොදාගත හැකි බව ප්‍රකාශ කළේ,

i. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමාය ii. ගරු තිස්ස බාලසූරිය පියතුමාය
iii. ගරු මයිකල් රුද්‍රිගු පියතුමාය iv. ගරු පීටර් ජෙරාඩ් පියතුමාය

39. පහත දැක්වෙන්නේ ශුද්ධ බයිබලීය සිදුවීම් කිහිපයකි

A- පාවුල්ට පිලිප්පියේදී ලිදියා මුණ ගැසීම
B- ජෙරමියා පාළු ළිඳකට දමනු ලැබීම
C- පේදුරු ජොප්පාවේදී දුටු දර්ශනය
D- ආබ්‍රහම් ලද දේව කැඳවීම

මේ අතුරෙන් දේව හඬට ක්ෂණික ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිබිඹු කරන සිදුවීම් නම්,

i. A හා C ය ii. B හා D ය iii. C හා E ය i. D හා E ය

40. කිතුනුවාගේ උසස්ම බලාපොරොත්තුව විය යුතු වන්නේ ,

i. ජීවිතයේ සියලු ගැටලු ජයගනිමින් සැපවත් දිවියක් හිමිකර ගැනීමයි
ii. ක්‍රිස්තුස්වහන්සේට හිමි වූවකු ලෙස සදාතන දිවිය උරුම කරගැනීමයි
iii. සියලු මනුෂ්‍යවර්ගයා කෙරෙහි ආධිපත්‍ය පැමට බලය ලබා ගැනීමයි
iv. දේව රාජ්‍යයේ පංගුකරුවන් ලෙස සමෘද්ධිමත් ජීවිත ගොඩනගා ගැනීමයි

(ල. 1x40=40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: Christianity | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

පළමුවන අනිවාර්ය ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සියලුම ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න

01.) i. පහත සඳහන් අය දේව හඬට දැක් වූ ප්‍රතිචාරය ලියා දක්වන්න
අ) සෙකරියස්තුමා
ආ) මරියතුමිය

ii. අ) පැරණි ගිවිසුමේ එඬේර ගීතය ලෙස හැඳින්වූයේ කුමක්ද?
ආ) එඬේර ගීතය මඟින් කිතුනුවන් වෙත පිරිනැමෙන බලාපොරොත්තුවක් ලියා දක්වන්න

iii. ඔබවහන්සේ යන ඕනෑම තැනකට වුවද මමත් ඔබ අනුව එන්නෙමි කී පුද්ගලයාට ජේසුස් වහන්සේ ලබා දුන් පිළිතුර කුමක්ද?

iv. ජේසුස් වහන්සේගේ බව්තීස්මයට සම්බන්ධ පහත සංකේත මඟින් පැහැදිලි වන සත්‍යතාව ලියා දක්වන්න
අ) පරවියා
ආ) ජලය

v. මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක් සඳහා ලැබෙන ආලෝකය කරුණු 2ක් මඟින් ඉදිරිපත් කරන්න

vi. මුල් කිතුනු සභාවේ නමස්කාරික ජීවිතය තුළින් කිතුනුවාට ලැබෙන ආදර්ශ 2ක් ලියන්න

vii. ''ඔබේ ඉඟපටි බැඳගන්න, පහන්ද දල්වා තබා ගන්න'' යන ප්‍රකාශයෙන් ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ වර්ධනය කිරීමට උත්සාහ කළ ගුණාංග 2ක් නම් කරන්න

viii. ඔබ ජීවත්වන සමාජයේ සාමය ඇති කිරීම සඳහා කිතුනු සිසුවකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 2ක් ලියන්න.

ix. පහත සඳහන් ප්‍රකාශයේ හිස්තැන් පුරවන්න.
''මාගේ නාමය අ)____________________ද රජුන්ද ආ)______________ ද වෙත ගෙන යෑමට මා විසින් තෝරා ගත් භාජනයකි.

x. දුක් විඳින සේවකයාණන්

අප වෙනුවෙන් ලද පහර නිසා → ↓ [ ]

අත් විඳි මරණය හේතුවෙන් → ↓ [ ]

හිස් තැන් පුරවන්න

(ලකුණු 2x10=20)

02.) කොන්දේසියක් ඇති එකම ආඥාව කමාවයි

i. කමාව සම්බන්ධව ඇති කොන්දේසිය කුමක්ද? (ල-2)

ii. පහත සඳහන් අය කමාව නමැති ගුණාංගය සිය ජීවිතයෙන් විදහා දැක්වූ අවස්ථාව බැගින් ලියන්න

අ) ජේසුස් වහන්සේ

ආ) දෙවන ජුවාම් පාවුළු පාප්තුමා

ඉ) පීටර් ජේරාඩ් පියතුමා (ල-3)

iii. කමාව පිළිබඳ ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් මඟින් ඔබ ඉගෙන ගත් විශේෂ කරුණු 5ක් ලියා දක්වන්න (ල-5)

03.) ඔවුහු 'සැඩොක්' නැමැත්තෙකුගෙන් පැවතෙන්නන් බව පැවසේ.

i. ඉහත ඔවුහු යන්නෙන් අදහස් වන්නේ කවරෙක්ද? (ල-2)

ii. ඔවුන් ජේසුස් වහන්සේ හා සම්බන්ධ වූ අවස්ථා තුනක් ලියා දක්වන්න (ල-3)

iii. වර්තමාන සමාජයේදී හමුවන එවැනි අය හමුවේ කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය කරුණු 5ක් මඟින් පහදන්න (ල-5)

04) 'දේව කැමැත්ත ඉටු කරන්නෝ දේව රාජ්‍යයේ පුරවැසිභාවය ලබති'

i. 'දේව රාජ්‍යය' යන්නෙන් ඔබ වටහා ගන්නේ කුමක්ද? (ල-2)

ii. පහත සටහන සම්පූර්ණ (ල-3)




iii. දේව රාජ්‍යයේ පුරවැසියන් විසින් ඔවුන්ගේ ජීවිතවල වර්ධනය කරගත යුතු ගුණාංග ලැයිස්තුවක් පිළියෙළ කරන්න. (ල-5)
(අවම වශයෙන් ඔබේ පිළිතුරෙහි ගුණාංග 5ක්වත් ඇතුලත් විය යුතුය)

05.) ''ස්වාමීනී ඔබ කවරෙක්ද?''

i. මෙය කවුරුන් විසින් කා හට පවසන ලද්දක්ද? (ල-2)

ii. මෙම සිදුවීමට සම්බන්ධ පුද්ගලයා ලද විස්මය ජනක අත්දැකීම් තුනක් ලියා දක්වන්න (ල-3)

iii. මෙම සිදුවීම මඟින් කිතුනුවාට ලැබෙන ආදර්ශ 5ක් පහදන්න (ල-5)

06.) 'පේදුරුතුමාගේ මෙහෙවර මුල් කිතුනු සභාවට ඉමහත් ආශිර්වාදයකි

i. පේදුරුතුමා ජේසුස් වහන්සේ වෙතින් ලැබූ කැඳවීම කුමක්ද? (ල-2)

ii. පහත සටහනේ ABC සම්පූර්ණ කරන්න. (ල-3)




iii. පේදුරුතුමාගේ මෙහෙවර මඟින් කිතුනුවන්ට ඉගෙන ගත හැකි පාඩම් 5ක් පැහැදිලි කරන්න. (ල-5)

07.) පහත දී ඇති මාතෘකාවලින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

i. ජුදා සමාජ දැක්ම

ii. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා

iii. සැබෑ මිදිවැල

iv. ආගන්තුක සත්කාරය (ල-5x2)